# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 673/8 – 1991 අගෝස්තු 01 වැනි බ්‍රහස්පතින්ද – 1991.08.01

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : I වැනි ඡෙදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**1980 අංක 26 දරන ආහාර පනත**

ආහාර උපදේශක කමිටුව විමසා, සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග.

රේණුකා හේරත් රණවීර,
සෞඛ්‍ය හා වනිතා කටයුතු අමාත්‍ය.

1991 ජූලි මස 17 වැනි දින,
කොළඹ දී ය.

මෙම නියෝග 1989 ආහාර ප්‍රමිති නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, 1991 අගෝස්තු මස 01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

6 වන කොටස – පළමු උපලේඛනය

**කිරි පිළිබඳ නියෝග**

"සකස් නොකළ හෝ අළුත් කිරි" යන්නෙන් යම් ද්‍රව්‍යයක් එකතු නොකර නැතහොත් මේද හෝ වෙනත් යම් අඩංගු ද්‍රව්‍යයක් නිශ්කර්ෂණය නොකර නිරෝගී එළදෙනුන් හෝ මී දෙනුන් එකකුගෙන් හෝ වැඩි දෙනකුගෙන් සම්පූර්ණයෙන් කිරි දෙවීමෙන් ලබාගත් (හැකිතාක් නවස්තන්‍යයෙන් නොහොත් කොලොස්ටරෝල් මිදුනු) සාමාන්‍ය, පැහැදිලි ක්ෂීරක ශ්‍රාවය අදහස් වේ; "සකස් නොකළ හෝ අලුත් කිරි"

"ප්‍රමිති කළ කිරි" යන්නෙන් ක්ෂීර මේදය හැර මෙහි I වන උපලේඛනයෙහි දක්වා ඇති පරිදි මේදය සහ ඝණ ද්‍රව්‍ය අනුව ප්‍රමිත කරනු ලැබ ඇත්තාවූ එළකිරි, මී කිරි හෝ ඒ දෙකෙහි සංයෝජනයක් අදහස් වේ; "ප්‍රමිති කළ කිරි"

"සකස් කළ කිරි" — "සකස් කළ" කිරි යන්නෙන් මෙහි I වන උපලේඛනයෙහි දක්වා ඇති ප්‍රමිති සැහීමට පත් කරනු පිණිස එළකිරිවලින් හෝ මීකිරි වලින් හෝ ඒ දෙකෙහි සංයෝජනයකින් හෝ ක්ෂීර මේදය සුදුසු ප්‍රමාණයක් නිශ්කර්ෂණය කිරීමෙන් සකස් කරනු ලැබූ නිෂ්පාදනයක් අදහස් වේ ;

"යොදය රහිත කිරි" — "යොදය රහිත කිරි" යන්නෙන් කිරි වලින් ක්ෂීර මේදය සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ලැබ ඇත්තා වූ ද ක්ෂීර මේදය සියයට 0.5 කට නොවැඩි ප්‍රමාණයක් අඩංගු වන්නා වූ ද එළ කිරිවලින් හෝ මී කිරිවලින් හෝ ඒ දෙකෙහි සංයෝජනයකින් සකස් කරනු ලැබූ නිෂ්පාදනයක් අදහස් වේ ;

"පැස්ටරි කෘත කිරි" — "පැස්ටරි කෘත කිරි" යන්නෙන් කිරි සෑම අංශුවක්ම යටත් පිරිසෙයින් සෙන්ටිග්‍රේඩ් 63° සෙ වන තෙක් උණුසුම් වන ආකාරයකින් උණුසුම් කරනු ලැබ, යටත් පිරිසෙයින් මිනිත්තු30 ක කාලයක් ඒ උෂ්ණත්වයෙහි අඛණ්ඩව තබනු ලැබුවා වූ නැතහොත් යටත් පිරිසෙයින් 71.5°සෙ. වන තෙක් උණුසුම් කරනු ලැබූ, යටත් පිරිසෙයින් මිනිත්තු 15 ක කාලයක් ඒ උෂ්ණත්වයෙහි අඛණ්ඩව තබනු ලැබුවා වූ නැතහොත් සෘණ පොස්පටේස් පරීක්ෂණයක් ලබාදීමට හැකි කෙරෙන ඊට සමාන්තර, වෙනත් යම් අනුමත උෂ්ණත්ව කල සංයෝජනයක් තබනු ලැබ ඉන් ඉක්බිතිවම 10° සෙ. හෝ ඊට අඩු ප්‍රමාණයක උෂ්ණත්වයකට සිසිල් කොට භාර දෙනු ලබන තෙක් ඒ උෂ්ණත්වයෙහි තබාගෙන ඇත්තාවූ කිරි අදහස් වේ ;

"ජීවානුහෘත කිරි" — "ජීවානුහෘත කිරි" යන්නෙන් කිරෙහි සිටින සියළු ජීවීන් විනාශ කිරීමට ප්‍රමාණවත් කාලයක් එහි උෂ්ණත්වය සම්බන්ධයෙන් සැලකිය යුතු පාඩුවක් නොමැතිව, 100°සෙ. උෂ්ණත්වයකට උණුසුම් කරනු ලැබ ඇත්තාවූ සහ භාරදීම සඳහා වායුරෝධක ඇසුරුම් බඳුන්වල අසුරනු ලැබූ කිරි අදහස් වේ ;

"අතිතාප පිළියමට භාජනය කළ කිරි" — "අතිතාප පිළියමට භාජනය කළ කිරි යන්නෙන්, එක් තත්පරයකට නොඅඩු කාලයක් 132° සෙ. උෂ්ණත්වයකට කිරිවල සණත්වය සම්බන්ධයෙන් සැලකිය යුතු පාඩුවක් නොමැතිව, උණුසුම් කරනු ලැබුවා වූ සහ ජීවාණුහෘත බඳුන්වල ප්‍රතිනාශ මුද්‍රා තබනු ලැබූ කිරි අදහස් වේ ;

"රසකළ කිරි" — "රස කළ කිරි" යන්නෙන් කිරි, සීනි සහ චොකලට් කොකෝ, කෝපි හෝ අවසර දෙනු ලැබූ වෙනත් රස කරන දේ වලින් සහ ආහාර පාට කිරීමේ ද්‍රව්‍ය ස්ථායිකරණ සහ අම්ල පාලන කාරකයන් ඇතිව හෝ නොමැතිව සකස් කරනු ලැබූ නිෂ්පාදනයක් අදහස් වේ.

### I වන උපලේඛනය – කිරිවල සංයුතිය

| I වන තීරය<br>කිරි වර්ගය | II වන තීරය<br>කිරිවල නාමය | III වන තීරය<br>ක්ෂීර මේදය අවම ප්‍රතිශතය | IV වන තීරය<br>ක්ෂීර මේදය හැර ක්ෂීර ඝණද්‍රව්‍ය අවම ප්‍රතිශතය |
|---|---|---|---|
| 1. මීකිරි | සකස් නොකළ පැස්ටරි කෘත හෝ ජීවාණු හෘත | 7.0 | 9.0 |
| 2. එළකිරි | එම | 3.5 | 8.5 |
| 3. ප්‍රමිත කළ | පැස්ටරි කෘත හෝ ජීවාණු හෘත | 3.25 | 8.25 |
| 4. සකස් කළ | එම | 2.0 | 8.5 |
| 5. රස කළ | එම | 2.0 | 7.2 |
| 6. යොදය රහිත හෝ මේදය රහිත | එම | – | 8.5 |

### II වන උපලේඛනය කිරි සම්බන්ධයෙන් ලේබල් ඇලවීමේ නියමයන්

| කිරි වර්ගය | ලකුණු කිරීමේ අක්ෂරය | |
|---|---|---|
| 1. මී කිරි | බී | |
| 2. එළ කිරි | සී | |
| 3. ප්‍රමිත කළ කිරි (ජීවානුහෘත) | එස්එස් | |
| 4. ප්‍රමිත කළ කිරි (පැස්ටරිකෘත) | එස්පී | |
| 5. සකස් කළ | ටී | |
| 6. යොදය රහිත | කේ | |
| 7. රස කළ | එෆ් | |
| 8. රස කළ (ජීවානුහෘත) | එෆ්එස් | කිරි වර්ගය දක්වන අක්ෂරය අනුව |
| 9. ජීවානුහෘත | එස් | කිරි වර්ගය දක්වන අක්ෂරය අනුව |
| 10. පැස්ටරිකෘත | පී | කිරි වර්ගය දක්වන අක්ෂරය අනුව |
| 11. අතිතාප පිළියමට භාජනය කළ කිරි | යූඑච්ටී | |

උදාහරණ : එළකිරි "සී" අක්ෂරයෙන් ද යොදය රහිත කිරි "කේ" අක්ෂරයෙන්ද රසකළ (ජීවානුහෘත) කිරි එෆ් එස් අක්ෂරවලින් ද ලකුණු කරනු ලැබේ.

## දෙවන උපලේඛනය - කිරි සහ කිරි නිෂ්පාදන

**" වාෂ්පීකෘත කිරි" (පැණි රස නොකළ උකු කිරි )**

" වාෂ්පීකෘත කිරි" (පැණි රස නොකළ උකු කිරි) යන්නෙන් එළකිරි වලින් හෝ මී කිරි වලින් හෝ ඒ දෙකෙන් සංයෝජනයකින් හෝ ජලය අර්ධ වශයෙන් ඉවත් කිරීමෙන් ප්‍රමිත කළ කිරි වලින් හෝ ලබා ගන්නා ලද නිෂ්පාදනයක් අදහස් වේ. එකතු කරනු ලැබූ කැල්සියම් ක්ලෝරයිඩ් එහි අඩංගු විය යුතුය. ක්ෂීර මේදය සියයට 8.0 ක ප්‍රමාණයක් සහ ක්ෂීර ඝණ ද්‍රව්‍යවලින් සියයට 28.0 කට නොඅඩු ප්‍රමාණයක් එහි ඇතුළත් විය යුතුය. සිට්රික් අම්ලය සහ සෝඩියම් සිට්රේට් එහි අඩංගු විය හැකිය.

**"උකු කිරි " (පැණි රස කළ)**

" උකු කිරි " (පැණි රස කළ) යන්නෙන් සීනි එකතු කිරීමෙන් පසුව, එළකිරි වලින් හෝ මී කිරි වලින් හෝ එහි සංයෝජනයකින් හෝ ජලය අර්ධ වශයෙන් ඉවත් කිරීමෙන් ප්‍රමිත කළ කිරිවලින් හෝ ලබාගන්නා ලද නිෂ්පාදනයක් අදහස් වේ. පැණි රස කළ උකු කිරිවල ක්ෂීර මේදය සියයට 8.0 කට අඩු ප්‍රමාණයක්, ක්ෂීර ඝණ ද්‍රව්‍ය සියයට 28.0 කට නොඅඩු ප්‍රමාණයක් සහ සුක්රෝස් (උක්සීනි) සියයට 40.0 නොඅඩු ප්‍රමාණයක් අඩංගු නොවිය යුතුය.

**" වාෂ්පීකෘත යොදය රහිත කිරි " (පැණි රස නොකළ - යොදය රහිත කිරි )**

" වාෂ්පීකෘත යොදය රහිත කිරි " (පැණි රස නොකළ යොදය රහිත උකුකිරි ) යන්නෙන් ජලය අර්ධ වශයෙන් ඉවත් කිරීමෙන් එළකිරි වලින් හෝ මී කිරිවලින් හෝ එහි සංයෝජනයකින් හෝ ලබා ගන්නා ලද නිෂ්පාදනයක් අදහස් වේ. පැණි රස නොකළ යොදය රහිත උකුකිරිවල මුළු ක්ෂීර ඝණ ද්‍රව්‍ය සියයට 20 කට නොඅඩු ප්‍රමාණයක් අඩංගු විය යුතුය. අඩංගු මේද ප්‍රමාණය සියයට 0.5 ක් නොඉක්ම විය යුතුය.

**"යොදය රහිත උකු කිරි " (පැණි රස කළ)**

"යොදය රහිත උකු කිරි " (පැණි රස කළ ) යන්නෙන් යොද රහිත එළකිරිවලින් හෝ මී කිරි වලින් ජලය ඉවත්කොට සීනි එකතු කිරීමෙන් පසුව ලබා ගන්නා ලද නිෂ්පාදනයක් අදහස් වේ. යොදය රහිත උකු කිරිවල (පැණි රස කළ ) මුළු ක්ෂීර ඝණ ද්‍රව්‍ය සියයට 24 කට නොඅඩු ප්‍රමාණයක් සහ සීනි සියයට 40 කට නො අඩු ප්‍රමාණයක් අඩංගු විය යුතුය. අඩංගු මේද ප්‍රමාණය සියයට 0.5 ක් නොඉක්මවිය යුතුය.

" වාෂ්පීකෘත කිරිවල" (පැණි රස නොකළ උකු කිරි ), උකු කිරිවල (පැණි රස කළ) වාෂ්පීකෘත යොදය රහිත කිරිවල (පැණි රස නොකළ උකු කිරි), යොදය රහිත උකු කිරිවල කැල්සියම් ක්ලෝරයිඩ් සිට්‍රික් අම්ලය, සෝඩියම් සිට්‍රේට්, සෝඩියම් සෝල්ට් ඕතෝෆොස්ෆරික් අම්ලය නිමහම් නිෂ්පාදනයෙන් සියයට 0.3 ක් නොඉක්ම වන ප්‍රමාණයන් අඩංගු විය හැකිය.

## තුන්වන උපලේඛණය.-උකු කිරි පිළිබඳ ලේබල් ඇලවීම සම්බන්ධයෙන් නියෝග

1. උකු කිරි අඩංගු සෑම ටින් එකක් හෝ වෙනත් භාජනයක් මත ලේබලයක් දැරිය යුතු අතර, ඒ මත අදාළ පරිදි පහත දැක්වෙන ප්‍රකාශවලින් එක් ප්‍රකාශයක් පැහැදිලි ලෙස මුද්‍රණය කොට තිබිය යුතුය.

(I) පැණි .රස නොකළ වාෂ්පීකෘත කිරි (උකුකිරි) සම්බන්ධයෙන් වන විට :

> පැණි රස නොකළ වාෂ්පීකෘත කිරි (උකුකිරි) කිරි පයින්ට් (අ) කට සමාන ප්‍රමාණයක් මෙම ටින් එකෙහි අඩංගු වේ.

(II) උකුකිරි (පැණි රස කළ) සම්බන්ධයෙන් වන විට :

> පැණි රස කළ උකුකිරි සීනි එකතු කරන ලද කිරි පයින්ට් (අ) සමාන ප්‍රමාණයක් මෙම ටින් එකෙහි අඩංගු වේ.

> පැණි රස නොකළ උකුකිරි කිරි පයින්ට් (අ) කට සමාන ප්‍රමාණයක් මෙම ටින් එකෙහි අඩංගු වේ.

ඒ සමග ටින් එකෙහි අඩංගු දෙයින් යටත් පිරිසෙයින් සාමාන්‍ය කිරිවලට සමාන සංයුතියක කිරි සෑදීම සඳහා ජලය මිශ්‍ර කිරීමේ අනුපාතය පැහැදිලිව ප්‍රකාශ කරමින් ලේබලය මත පහත දැක්වෙන පරිදි ප්‍රකාශයක් ප්‍රකට ස්ථානයක දැක්විය යුතුය.

| |
|---|
| කිරිවල සංයුතියට අඩු නොවන ද්‍රව්‍යයක් සෑදීමට සණ ප්‍රමාණයෙන් මෙම කිරි (I) එක් කොටසකට සණ ප්‍රමාණයෙන් ජලය කොටස් (ආ) එකතු කරන්න |

2. එක් එක් විෂය සම්බන්ධයෙන් වූ ප්‍රකාශවල (අ) සහ (ආ) ස්ථානයෙහි උචිත සංඛ්‍යාව වචනවලින් සහ ඉලක්කම් වලින් ඇතුළත් කිරීමෙන් සම්පූර්ණ කරන්න.

උදාහරණ :– " එකහමාරැ ! "

මෙම රීතිවල කාර්ය සඳහා " කිරි " යන්නෙන් ක්ෂීර මේද හැර, ක්ෂීර සණ ද්‍රව්‍ය සියයට 8.25 කට නොඅඩු ප්‍රමාණයක් සහ ක්ෂීර මේදය සියයට 3.25 කට නොඅඩු ප්‍රමාණයක් අඩංගු වන කිරි අදහස් වේ.

3. (අ) නියමිත ප්‍රකාශ ලා පැහැති පසුබිමක් මත පැහැදිලිව මුද්‍රණය කළ යුතුය.

(ආ) ප්‍රකාශ කොටු කෙරෙන රේඛාවක් ඒ වටා විය යුතුය.

(ඇ) මෙහි මින් පෙර නියමිත කරුණක් නොවන කිසිම කරුණක්, වටා ඇති රේඛාව ඇතුළත මුද්‍රණය නොකළ යුතුය.

(ආ) මීට අතිරේකව ලේබල් ඇලවීම සම්බන්ධයෙන් වූ නියෝගවල වෙනත් අදාළ නියමයන් අනුව ලේබලය සකස් කළ යුතුය.

දෙවන උපලේඛනය–වියළි කිරි සම්බන්ධයෙන් ලේබල් ඇලවීම පිළිබඳ නියෝග

1. (I) (සීනි හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් එකතු කරනු ලැබ ඇත්තා වූ වියළි කිරි හැර) වියළි කිරි අඩංගු සෑම ටින් එකක හෝ වෙනත් බඳුනක ලේබලයක් දැරිය යුතු අතර, ඒ ලේබලය මත අදාළ පරිදි පහත දැක්වෙන ප්‍රකාශවලින් එක් ප්‍රකාශයක් හෝ සාරානුකූල වශයෙන් එම ඵලය ගෙන දෙනු ලබන අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් ප්‍රකාශයක් මුද්‍රණය කළ යුතුය :–

(II) සම්පූර්ණයෙන් යොදය සහිත වියළි කිරි, එනම් :– ක්ෂීර මේදය සියයට 26 කට නොඅඩු ප්‍රමාණයක් අඩංගු කිරි සම්බන්ධයෙන් වන විට, –

| |
|---|
| සම්පූර්ණයෙන් යොදය සහිත වියළි කිරි පයින්ට් (අ) කට සමාන ප්‍රමාණයක් මේ ටින් එකෙහි අඩංගු වේ. |

(III) යොදය රහිත කිරි එනම් .– ක්ෂීර මේදය සියයට 8 කට අඩු ප්‍රමාණයක් අඩංගු වියළි කිරි සම්බන්ධයෙන් වන විට :–

| |
|---|
| මේදය රහිත වියළි කිරි |

ළදරුවන්ට සුදුසු නැත (හෝ ළදරුවන් සඳහා පාවිච්චි නොකළ යුතුය.)

| |
|---|
| යොදය රහිත කිරි පයින්ට් (අ) කට සමාන ප්‍රමාණයක් මේ ටින් එකෙහි අඩංගුවේ. |

(3) ප්‍රකාශය පහත දැක්වෙන පරිදි සම්පූර්ණ කළ යුතුය :–

(I) ස්ථානයෙහි උචිත සංඛ්‍යාව වචන වලින් සහ ඉලක්කම්වලින් ඇතුළත් කළ යුතුය. උදාහරණ :– " එකහමාරක් (1 1/2) " සමාන අංකයක් අටෙන්, හතරෙන් හෝ දෙකෙන් එකක් වශයෙන් ප්‍රකාශ කළ යුතුය.

(4) මේ රීතියේ කාර්ය සඳහා " කිරි " යන යෙදුමෙන් ක්ෂීර මේදය සියයට 3.6 කට සහ ක්ෂීර මේදය හැර, ක්ෂීර ඝණ ද්‍රව්‍ය සියයට 8. 8 කට නොඅඩු ප්‍රමාණයක් අඩංගු කිරි අදහස් වන අතර, " යොදය රහිත කිරි " යන යෙදුමෙන් ක්ෂීර මේදය හැර වෙනත් ක්ෂීර ඝණ ද්‍රව්‍ය සියයට 9කට නොඅඩු ප්‍රමාණයක් අඩංගු කිරි අදහස් වේ.

ලේබලයෙහි ප්‍රකාශයක් ද තිබිය යුතු අතර එම ලේබලයෙන් ටින් එකෙහි හෝ බඳුනෙහි අඩංගු කිරිවල සංයුතිය, යටත් පිරිසෙයින් ඒ කිරි හෝ යොදය රහිත කිරි සෑදීම සඳහා ජලය මිශ්‍ර කිරීමේ අනුපාතය, පැහැදිලිව ප්‍රකාශ කරමින් ලේබලයේ ප්‍රකට ස්ථානයක දැක්විය යුතුය.

| |
|---|
| (අ) ක සංයුතියට පහත් නොවන ද්‍රව්‍යයක් සෑදීමට ජලය අවුන්ස (ඇ) කට මෙම කිරි පිටි බරින් අවුන්ස (ආ) ක ප්‍රමාණයක් එකතු කරන්න. |

3. (අ) නියමිත ප්‍රකාශය ලා පැහැති පසුබිමක් මත තද කලු පැහැති ලොකු අකුරින් මුද්‍රණය කළ යුතුය.

(ආ) ප්‍රකාශය කොටු කෙරෙන ඒ වටා රේඛාවක් විය යුතු අතර, " සුදුසු නැත " (නැතහොත් " ළදරුවන් සඳහා පාවිච්චි කිරීමට සුදුසු නැත " ) යන වචනය පාවිච්චි කිරීමට නියම කරනු ලැබ ඇති අවස්ථාවක, එම වචන වට කෙරෙන වෙනත් එවැනි රේඛාවක් විය යුතුය.

(ඇ) " සුදුසු නැත " (නැතහොත් "ළදරුවන් සඳහා පාවිච්චි කිරීමට සුදුසු නැත " ) යන වචන වල යම් කොටසක් සහ එම වචන වට කෙරෙන ඒ වටා ඇති රේඛාව අතර දුර ප්‍රමාණය අඟලකින් දහසයෙන් එකකට අඩු නො විය යුතුය.

(ඇ) මෙහි මින් පෙර නියමිත කරුණක් නොවන කිසිම කරුණක්, වටා ඇති රේඛාව ඇතුළත මුද්‍රණය නොකළ යුතුය.

(ඉ) ප්‍රකාශය සඳහා කවර හෝ කොටසක පාවිච්චි කරනු ලබන අකුරු වර්ගය උසින් අඟලකින් දහයෙන් එකකට අඩු නොවිය යුතුය. (නැතහොත් ටින් එකෙහි හෝ වෙනත් බඳුනෙහි දළ බර ප්‍රමාණය අවුන්ස දොළහක් නො ඉක්මවන්නේ නම් උසින් අඟලකින් දහසයෙන් එකකට අඩු නොවිය යුතුය) තවද, " සුදුසු නැත " (නැතහොත් " ළදරුවන් සඳහා සුදුසු නැත " ) යන වචනය සඳහා පාවිච්චි කරනු ලබන අකුරු වර්ගය ප්‍රකාශයේ වෙනත් යම් කොටසක උස මෙන් දෙගුණයකට අඩු නොවිය යුතුය.

4. මීට අතිරේකව වියළි කිරිවල නිෂ්පාදකයාගේ නම සහ ලිපිනය හෝ එය නිෂ්පාදනය කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ යම් බෙදාහරින්නකු හෝ වෙළෙන්දකු සඳහා ද ඒ බෙදාහරින්නාගේ හෝ වෙළෙන්දාගේ නම සහ ලිපිනය හෝ වෙළෙඳ ලකුණ අයිතිකරුගේ නම සහ ලිපිනය සහ ටින් එකෙහි හෝ වෙනත් බඳුනේ අඩංගු කිරි පිටිවල ශුද්ධ බර, ලේබලයෙහි සඳහන් කළ යුතුය.

5. ලේබලය ටින් එකෙහි හෝ වෙනත් බඳුනෙහි මැනවින් ඇලවිය යුතුය. නම වෙළෙඳ ලකුණ වියළි කිරිපිටි වර්ගය නියෝජනය කෙරෙන මෝස්තරය නියමිත ප්‍රකාශ එම ලේබලයේ කොටසක් වශයෙන් මුද්‍රණය කළ යුතුය.

6. " කිරි " හෝ " යොදය රහිත කිරි " ටින් එකක හෝ බඳුනක අඩංගු කිරිවල විස්තරය වශයෙන් හෝ විස්තරයේ කොටසක් වශයෙන් " කිරි " යන වචනය ටින් එකෙහි හෝ ලේබලයේ දැක්වෙන කවර හෝ විටෙක, අවස්ථාවෝචිත පරිදි " කිරි " හෝ යොදය රහිත කිරි " යනුවෙන් ලේබලයෙහි දැක්විය යුතුය.

08–643

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

2 - D 15349